අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2024 (2025)**
**கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை- 2024 (2025)**
General Certificate of Education (Ord. Level) Examination - 2024 (2025)

අනුහුරු ප්‍රශ්න පත්‍රය (සිංහල මාධ්‍යය)
**பயிற்சி வினாத்தாள்**
**Practice Paper**

# පුරවැසි අධ්‍යාපනය
## Civic Education - குடியியற் கல்வி




අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு - மொழிகள் மற்றும் மானுடவியல் பிரிவு
*Ministry of Education, Higher Education and Vocational Education –National Languages and Humanities Branch*
The National e-learning Portal for the General Education

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

| 62 | S | I |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය (අනුහුරු ප්‍රශ්න පත්‍රය ) - 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை (பயிற்சி வினாத்தாள்) – 2024 (2025)
General certificate of Education (ord. Level) Examination (Practice Paper) - 2024 (2025)

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civics Education I, II

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත්, යොදාගන්න.

## පුරවැසි අධ්‍යාපනය - I

**සැලකිය යුතුයි.**
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව නිදහසයි." මෙම ප්‍රකාශය කරනු ලැබුයේ,

   (1) ඇරිස්ටෝටල් ය. (2) ගානර් ය. (3) ජී.ඩී.එච්. කෝල් ය. (4) ඒබ්‍රහම් ලින්කන් ය.

2. සන්ධීය රාජ්‍යවල ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු 'කැන්ටන්' නමින් හඳුන්වන රට වන්නේ,

   (1) ස්විට්සර්ලන්තය (2) ඉන්දියාව (3) චීනය (4) ඇමරිකා එක්සත් ජනපදය

3. ශ්‍රී ලාංකික බහු සංස්කෘතික ජන සමාජයේ සාර්ථක පාලනයකට අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය හැඳින්වීමට භාවිත වන සංකල්පය වන්නේ,

   (1) යහජීවනය (2) සමෝධානය (3) සහජීවනය (4) යහපාලනය

4. ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා හඳුන්වා දී ඇති කෙටි දුරකථන අංකය වන්නේ,

   (1) 1990 (2) 1929 (3) 1954 (4) 1919

5. ශ්‍රී ලංකාවේ උතුරු දුම්රිය මාර්ගය සංවර්ධනය වෙනුවෙන් විදේශ ආධාර ලබාදුන් රට වන්නේ,

   (1) ඉරානය (2) චීනය (3) ජපානය (4) ඉන්දියාව

6. සදාචාරාත්මක යුතුකමකට නිදසුනක් වන්නේ,

   (1) පවතින නීතියට ගරු කිරීම ය.
   (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම ය.
   (3) රජයට නියමිත බදු ගෙවීම ය.
   (4) පුද්ගලයාගේ හෘද සාක්ෂියට අනුව කටයුතු කිරීම ය.

7. රටක අභ්‍යන්තර ගැටුම් වර්ග කර ඇත්තේ,

(1) වාර්ගික ගැටුම් හා දේශපාලන ගැටුම් ලෙස ය. (2) මතවාදී ගැටුම් හා යුධමය ගැටුම් ලෙස ය.
(3) සාර්ව ගැටුම් හා සූක්ෂ්ම ගැටුම් ලෙස ය. (4) ආගමික ගැටුම් හා වාර්ගික ගැටුම් ලෙස ය.

8. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ස්වාධීන පාලනයකට ඉඩකඩ නොලැබෙන පරිදි 1833, 1910, 1924 යන වර්ෂවල සිදු වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලද්දේ,

(1) ලන්දේසි ජාතිකයන් විසිනි. (2) පෘතුගීසි ජාතිකයන් විසිනි.
(3) ප්‍රංශ ජාතිකයන් විසිනි. (4) බ්‍රිතාන්‍ය ජාතිකයන් විසිනි.

9. ශ්‍රී ලංකාව සඳහා ඎකියා වෙළෙඳ පොළක් නිර්මාණය කිරීමේ දී වැඩි ම දායකත්වයක් දක්වන රටවල් දෙකක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) දකුණු කොරියාව හා ජපානය (2) බ්‍රසීලය හා ඉතාලිය
(3) රුමේනියාව හා කසකස්ථානය (4) චීනය හා මෙක්සිකෝව

10. 'ප්‍රජාතන්ත්‍රවාදය' පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන්නේ,

(1) අන්‍ය මතවලට ගරු කිරීම නිසා ය. (2) මහජන කැමැත්ත මත සිදුවීම නිසා ය.
(3) සමානාත්මතාවයට ගරු කිරීම නිසා ය. (4) සාකච්ඡා මගින් තීරණවලට එළඹීම නිසා ය.

11. "වෙනස්කම් තුළින් එකමුතු බව" යන තේමාව පදනම් කරගෙන සංවර්ධිත තත්ත්වයට පත් වූ රටවල් දෙක වන්නේ,

(1) සිංගප්පූරුව හා පින්ලන්තය (2) සිංගප්පූරුව හා ස්විට්සර්ලන්තය
(3) ස්විට්සර්ලන්තය හා මැලේසියාව (4) ස්විට්සර්ලන්තය හා පාකිස්ථානය

12. අන්තර්, පාරිභෝගික හා ප්‍රාග්ධන යන භාණ්ඩ වර්ගීකරණය පිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) පොහොර, සහල් හා වාහන (2) වාහන, සහල් හා පොහොර
(3) ඖෂධ, යන්ත්‍ර සූත්‍ර හා පොහොර (4) පොහොර, යන්ත්‍ර සූත්‍ර හා සීනි

13. නව ලිබරල්වාදී වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයක ලක්ෂණයක් වන්නේ,

(1) පොදු දේපළ ප්‍රවර්ධනය කිරීම (2) පාලන නීති රීති, සීමා දැඩි කිරීම
(3) පෞද්ගලික ආයෝජකයන් දිරිගැන්වීම (4) රාජ්‍ය අංශයේ පූර්ණ මැදිහත් වීම

14. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රේෂ්ඨාධිකරණය සතු විශේෂිත බලයක් වන්නේ,

(1) මහ මැතිවරණ පෙත්සම් විභාග කිරීම (2) රිට් ආඥා නිකුත් කිරීම
(3) මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම (4) නාවුක අධිකරණ බලය

15. කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතියට (CEDAW) ශ්‍රී ලංකාව අත්සන් කර ඇති වර්ෂය වන්නේ,

(1) 1993 (2) 1979 (3) 1980 (4) 1981

16. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන විසින් සපයන පොදු උපයෝගීතා සේවාවක් වන්නේ,

(1) මහජන වෙළෙඳ පොළ පවත්වාගෙන යාම ය. (2) මංමාවත් ආරක්ෂා කිරීම ය.
(3) අහිතකර ගොඩනැගිලි ඉවත් කිරීම ය. (4) පොදු වැසිකිළි - කැසිකිළි පවත්වාගෙන යාම ය.

17. රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති අයිතිවාසිකම් හඳුන්වන්නේ,

(1) මානව අයිතිවාසිකම් ලෙස ය. (2) මූලික අයිතිවාසිකම් ලෙස ය.
(3) දේශපාලන අයිතිවාසිකම් ලෙස ය. (4) සිවිල් අයිතිවාසිකම් ලෙස ය.

18. ජාතික පරිසර පනතට අනුව පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කේන්ද්‍රීය ආයතනය වන්නේ,

(1) මධ්‍යම පරිසර අධිකාරිය යි. (2) පරිසර අමාත්‍යාංශය යි.
(3) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යි. (4) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය යි.

19. ශ්‍රී ලංකාවේ ඉහළ මට්ටමේ සිට පහළ ම මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කර ඇති ධූරාවලිය තෝරන්න.

(1) පළාත්, ජාතික, දිස්ත්‍රික්, ග්‍රාම නිළධාරී (2) ජාතික, පළාත්, ප්‍රාදේශීය, දිස්ත්‍රික්
(3) ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය, ග්‍රාම නිළධාරී (4) දිස්ත්‍රික්, ජාතික, ග්‍රාම නිළධාරී, පළාත්

20. රටක වැඩ කරන ජනතාව උදෙසා සමාජ සාධාරණත්වය ඉටු කිරීම අරමුණු කරගෙන පිහිටුවා ඇති ජාත්‍යන්තර සංවිධානය වන්නේ,

(1) අන්තර්ජාතික මානව හිමිකම් සංවිධානය (2) අන්තර්ජාතික රතු කුරුස සංවිධානය
(3) ලෝක සෞඛ්‍ය සංවිධානය (4) අන්තර්ජාතික කම්කරු සංවිධානය

21. පාලන කටයුතුවල දී සෘජුව ම ජනතාවගේ අදහස් විමසන ක්‍රමයක් වන්නේ,

(1) ජනමත විචාරණය (2) ජනාධිපතිවරණය
(3) පාර්ලිමේන්තු මැතිවරණය (4) පළාත් පාලන මැතිවරණය

22. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසිය වන්නේ,

(1) නියමිත කාලසීමාව තුළ මැතිවරණ පැවැත්වීම
(2) නිදහස් හා සාධාරණ පදනමක් මත මැතිවරණ පැවැත්වීම
(3) සියලු දෙනාගේ සහභාගීත්වයෙන් මැතිවරණ පැවැත්වීම
(4) සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම

23.

- ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තනතුරකි.
- වැටුප් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබන අතර එය අඩු කළ නොහැකිය.
- 1994 න් පසු ලාංකික ඕනෑම පුරවැසියෙකුට සිය පැමිණිල්ල සෘජුවම මොහු වෙත ඉදිරිපත් කළ හැකිය.

ඉහත සඳහන් ප්‍රකාශන මගින් කියැවෙන ආරවුල් විසඳීම සම්බන්ධයෙන් වැදගත් වන පුද්ගලයා වන්නේ,

(1) නීතිපතිතුමා ය. (2) අධිකරණ අමාත්‍යතුමා ය.
(3) පාර්ලිමේන්තු කොමසාරිස්තුමා ය. (4) අග්‍රවිනිශ්චයකාරතුමා ය.

24. ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ දී පදනම් කරගත් නිශ්චිත අරමුණු නිවැරදි ව සඳහන් ප්‍රකාශය තෝරන්න.

(1) පෝෂණය, අධ්‍යාපනය, සහභාගීත්වය, සංවර්ධනය
(2) පෝෂණය, පැවැත්ම, සෞඛ්‍යය, අධ්‍යාපනය
(3) ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය, සහභාගීත්වය
(4) නිදහස, සමානාත්මතාවය, සහයෝගය, අධ්‍යාපනය

25. කලාපීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සංවිධාන බොහොමයක් පිහිටුවා ඇත්තේ,

(1) භූගෝලීය පිහිටීම පදනම් කරගෙන ය. (2) දේශපාලන හේතු පදනම් කරගෙන ය.
(3) තාක්ෂණික දියුණුව පදනම් කරගෙන ය. (4) සංවර්ධන මට්ටම් පදනම් කරගෙන ය.

26. මානව ක්‍රියා මූලික වීමෙන් සිදුවන පාරිසරික හානි ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) නායයාම්, ලැව් ගිනි, ජෛව විවිධත්ව හායනය
(2) භූමිකම්පා, ගිනි කඳු පිපිරීම, අයිස් වැස්ම දිය වී යාම
(3) සුනාමි, හිම කඳු කඩා වැටීම, ගෝලීය උණුසුම් වීම
(4) ගෝලීය උණුසුම් වීම, ජෛව විවිධත්ව හායනය, අයිස් වැස්ම දිය වී යාම

27. වර්තමාන ලෝකයේ දේශ සීමා සාධකය මත ගැටුම්වලට සම්බන්ධ වී ඇති රටවල් දෙකක් වන්නේ,

(1) ඊශ්‍රායලය හා පලස්තීනය
(2) රුසියාව හා යුක්‍රේනය
(3) සෝමාලියාව හා ඉතියෝපියාව
(4) ඉරානය හා කුවේටය

28. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පළාත් සභා පිහිටුවීමට අදාළ පනත වන්නේ,

(1) 1987 අංක 15 දරන පනත
(2) 1987 අංක 42 දරන පනත
(3) 1994 අංක 26 දරන පනත
(4) 1996 අංක 21 දරන පනත

29. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ලක්ෂණයක් වන්නේ,

(1) විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබීම ය.
(2) විධායකය, ව්‍යවස්ථාදායකයට සෘජුව වගකීමට බැඳී නැත.
(3) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වේ.
(4) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සෘජු සම්බන්ධයක් පවතී.

30. බහු සංස්කෘතික සමාජයක ජීවත් වීමේ දී,

(1) විවිධ සංස්කෘතීන් මිශ්‍ර වීම වැළැක්විය යුතු ය.
(2) වැඩි පිරිසක් අදහන ආගමට ප්‍රමුඛත්වය හිමි විය යුතු ය.
(3) අනෙකුත් ජනවර්ගවල භාෂාවන් ඉගෙන ගත යුතු ය.
(4) තම සංස්කෘතිය ඉස්මතු වන අයුරින් කටයුතු කළ යුතු ය.

31. ගැටුම් නිරාකරණයට මැදිහත්කරුවෙකු තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණක් වන්නේ,

(1) එක් පාර්ශ්වයක් පමණක් පිළිගන්නා පුද්ගලයෙකු විය යුතු ය.
(2) දෙපාර්ශ්වයට ම බලපෑම් එල්ල කළ හැකි අයෙකු විය යුතු ය.
(3) ජය-ජය විසඳුම් ලබා ගැනීමට මග සලසන්නෙකු විය යුතු ය.
(4) තමන්ගේ තීරණ පාර්ශ්වකරුවන් මත බලහත්කාරයෙන් යොදවන්නෙකු විය යුතු ය.

32. මෑතකාලීන ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගැනීමේ ක්‍රමවේද අතුරින් රාජ්‍ය උපාය සබඳතාවයක් ලෙස වැදගත් වන්නේ,

(1) තම නිෂ්පාදන වෙනත් රටවල් සමඟ හුවමාරු කර ගැනීම ය.
(2) තානාපතිවරු, මහ කොමසාරිස්වරු මගින් රාජ්‍ය සබඳතා ගොඩනගා ගැනීම ය.
(3) යුධමය වශයෙන් අවශ්‍ය විශේෂඥ පුහුණුව රටවලට ලබාදීම ය.
(4) රටවල් ඒකරාශී කර විවිධ කලාපීය සංවිධාන පිහිටුවා ගැනීම ය.

33. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලය තුළ නිෂේධ බලය හිමි රටවල් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) චීනය, රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය
(2) රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව
(3) ප්‍රංශය, චීනය, උතුරු කොරියාව
(4) බ්‍රිතාන්‍ය, රුසියාව, දකුණු අප්‍රිකාව

34. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සමස්ත මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව වන්නේ,

(1) මහජන ඡන්දයෙන් 101 හා ජාතික ලැයිස්තුවෙන් 30
(2) මහජන ඡන්දයෙන් 151 හා ජාතික ලැයිස්තුවෙන් 06
(3) මහජන ඡන්දයෙන් 168 හා ජාතික ලැයිස්තුවෙන් 29
(4) මහජන ඡන්දයෙන් 196 හා ජාතික ලැයිස්තුවෙන් 29

35. නීතිය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) වෙනස් වන සමාජ අවශ්‍යතා අනුව නීතිය වෙනස් නොවිය යුතු ය.
(2) සිවිල් නීතිය අදාළ වන්නේ ලංකාවේ වාසය කරන දමිළ ජනතාවට පමණි.
(3) පුද්ගල සබඳතා අපරාධ නීතියට යටත් ව ක්‍රියාත්මක වේ.
(4) රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ දී උත්තරීතර නීතිය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යි.

36. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කරගැනීමට විරුද්ධ පක්ෂයෙන් ඉටු කරගත යුතු කාර්යයක් **නොවන්නේ,**

(1) සංවර්ධනාත්මක විවේචනය තුළින් ආණ්ඩුව සුමගට යොමු කිරීම
(2) ආණ්ඩු පක්ෂයේ යහපත් කටයුතුවලට සහයෝගය දීම
(3) ආණ්ඩු පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපත්තිවලට විරුද්ධ නොවීම
(4) වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට කටයුතු කිරීම

37. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක 'බලය' යන්නෙන් අදහස් කරන්නේ,

(1) බලය හසුරවන අය තමාට කැමති ආකාරයට බලයට යටත් වන අය පාලනය කිරීම ය.
(2) ආර්ථිකයක් තුළ ආධිපත්‍යධාරී පිරිසක් විසින් අනෙක් අය මෙහෙයවීමට උත්සාහ ගැනීම ය.
(3) සමාජය තුළ ජීවත් වන පුද්ගලයන් සහ පවතින සමාජ සංවිධාන අභිබවා කටයුතු කිරීම ය.
(4) රාජ්‍යයේ පාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා එම රාජ්‍යයට ඇති හැකියාව ය.

38. පහත සඳහන් කරුණු අතුරින් තිරසර සංවර්ධනය ළඟාකර ගැනීමේ දී වැදගත් වන සාධක ඇතුළත් පිළිතුර වන්නේ,

A - පරිසර හිතකාමී සම්පත් පරිභෝජනය
B - සෞන්දර්යාත්මක බව රැක ගැනීම
C - මිහිතලයට දැරිය හැකි සංවර්ධනය
D - ලාභ උපරිම කරගැනීමේ නිෂ්පාදන ආකල්ප

(1) ABC (2) ABD (3) ACD (4) BCD

39. 'අ' තීරුවෙන් ලෝකයේ රටවල් පිහිටුවාගත් සංවිධාන හා 'ආ' තීරුවෙන් එම සංවිධානවල අරමුණු දැක්වේ. 'අ' තීරුව හා 'ආ' තීරුව නිවැරදි ව ගැළපූ විට පිළිතුර වන්නේ,

| 'අ' | 'ආ' |
|---|---|
| 1. යුරෝපා සංගමය (EU) | A- නිදහස් වෙළෙඳාම |
| 2. උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA) | B- තාක්ෂණික හුවමාරුව |
| 3. දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුම (SAPTA) | C- මූල්‍ය ගනුදෙනු වඩා ක්‍රමවත් කිරීම |
| 4. බිම්ස්ටෙක් (BIMSTEC) | D- කලාපීය වෙළෙඳාම පුළුල් කිරීම |

(1) CABD (2) CADB (3) CBAD (4) CDBA

40. පහත A හා B ප්‍රකාශ සලකා බලන්න.

A - දළ දේශීය නිෂ්පාදිතය හා විදේශීය ශුද්ධ සාධක ආදායමේ එකතුව දළ ජාතික නිෂ්පාදිතය යි.
B - ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ දී ආර්ථික තොරතුරු පමණක් සලකා බැලීම සිදු කරයි.

මෙම ප්‍රකාශ අතුරින්,

(1) A ප්‍රකාශය මගින් B ප්‍රකාශය පැහැදිලි කරයි.
(2) A ප්‍රකාශය අසත්‍ය වන අතර B ප්‍රකාශය සත්‍ය වේ.
(3) A ප්‍රකාශය සත්‍ය වන අතර B ප්‍රකාශය අසත්‍ය වේ.
(4) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වේ.

**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

62 | S | II

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය- 2024 (2025)

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

## පුරවැසි අධ්‍යාපනය II

- ❖ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1.

I. ලෝකයේ රාජ්‍යයන් පාලනය කිරීම සඳහා අතීතයේ සිට භාවිත කර ඇති පාලන ක්‍රම **දෙකක්** ලියන්න.

II. ජන සමාජයක සංස්කෘතිය මෙහෙයවන ප්‍රධාන බලවේග **දෙකක්** නම් කරන්න.

III. "කෙසේ නිෂ්පාදනය කළ යුතු ද?" යන මූලික ආර්ථික ප්‍රශ්නයේ දී මුහුණ දීමට සිදුවන අතුරු ප්‍රශ්න **දෙක** ලියන්න.

IV. ගැටුම් හා සම්බන්ධ 'චර්යාව' ප්‍රධාන වශයෙන් කොටස් **දෙකකි**. ඒවා නම් කරන්න.

V. අපරාධ නීතිය හා සම්බන්ධ 'විශේෂ' දඬුවම් **දෙකක්** ලියන්න.

VI. මානව හිමිකම්වල ස්වරූපය අනුව වර්ග කර ඇති අයිතිවාසිකම් **දෙක** සඳහන් කරන්න.

VII. පරිසර පද්ධතිය සකස් වී ඇති සංරචක **දෙකක්** ලියන්න.

VIII. අන්තර්ජාතික වෙළෙඳාමේ ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.

IX. ප්‍රජාතන්ත්‍රවාදී රටවල නියෝජිතයින් තෝරා ගැනීම සඳහා බහුලව භාවිතා කරන නියෝජන ක්‍රම **දෙකක්** නම් කරන්න.

X. මනසේ සාමය ඇති කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රම **දෙකක්** ලියන්න.

(ලකුණු 02 × 10 = 20)

02) තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සියලු දෙනාම සම්බන්ධ වීම අතීතයේ සිට ම සිදු වී ඇත.

I. ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භය සම්බන්ධයෙන් පෙරදිග හා අපරදිග ප්‍රදේශවල පැවති පාලන ක්‍රම **දෙක** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

II. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් ජනමාධ්‍ය මගින් ඉටුකළ යුතු කාර්යයන් **තුනක්** ලියන්න. (ලකුණු 03)

III. (a) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වන රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(b) ඉහත (a) හි සඳහන් **එක්** ප්‍රයෝජනයක් රටකට වැදගත්වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

03) සෑම සමාජයක ම සංස්කෘතිය එම සමාජයේ පැවැත්ම මෙහෙයවන ප්‍රධාන බලවේගය යි.

I. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපෑ සංක්‍රමණික සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

II. බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග **තුනක්** ලියන්න. (ලකුණු 03)

III. (a) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(b) රටක ප්‍රගමනය සඳහා ඉහත (a) හි සඳහන් **එක්** කරුණක් හේතුවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

04) තාක්ෂණික දියුණුව හා ගෝලීයකරණය වර්තමාන ලෝක ආර්ථිකයේ තීරණාත්මක සාධකය බවට පත් වී ඇත.

I. සමාජවාදී වෙළෙඳ පොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබුණු රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

II. ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකය තුළ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03)

III. (a) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට හිමි වී ඇති වාසිදායක බලපෑම් **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(b) ඉහත (a) හි සඳහන් **එක්** වාසිදායක බලපෑමක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

05) මිනිසුන්ගේ ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සංවර්ධනය ලෙස අර්ථ දැක්විය හැකිය.

I. සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන සාම්ප්‍රදායික මිනුම් **දෙකක්** ලියන්න. (ලකුණු 02)

II. ලෝකයේ සංවර්ධිත රටවල් මුහුණපාන ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

III. (a) සම්පත්වල ඵලදායීතාවය දියුණු කිරීමට යොදා ගන්නා ලෝකයේ භාවිත වන උපායමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ඉහත (a) හි සඳහන් **එක්** උපාය මාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

06) අන්තර්ජාතික වශයෙන් රටවල් අතර පවතින සහයෝගීතාවය ගෝලීය ප්‍රජාවගේ දියුණුව වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කරයි.

I. වර්තමානයේ බලවත් රාජ්‍ය විසින් බලයෙන් අඩු රාජ්‍ය වෙත බලපෑම් එල්ල කරන ක්ෂේත්‍ර **දෙකක්** ලියන්න. (ලකුණු 02)

II. ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීමෙහිලා බලපාන සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03)

III. (a) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය තුළ ඇති ප්‍රධාන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(b) ඉහත (a) හි දැක්වූ එක් ආයතනයක කාර්යයන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

07) මිනිසුන්ගේ බාහිර හැසිරීම පාලනය කිරීම සඳහා සමාජයක් විසින් පනවනු ලබන රෙගුලාසි මාලාව නීතිය වේ.

I. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතියට අමතරව පවතින වෙනත් නීති **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

II. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** ලියන්න. (ලකුණු 03)

III. (a) නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(b) සාධාරණ හා යුක්ති සහගත සමාජයක් බිහිකිරීම සඳහා ඉහත (a) හි සඳහන් **එක්** කරුණක් දායක වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

***

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ 2024(2025)

# අනුහුරු ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු පත්‍රය (සිංහල මාධ්‍යය)
# Answer Sheet for the model paper
# மாதிரி வினாத்தாளுக்கான விடைத்தாள்

# පුරවැසි අධ්‍යාපනය

## CIVIC EDUCATION - குடியியற் கல்வி




අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு - மொழிகள் மற்றும் மானுடவியல் பிரிவு
Ministry of Education, Higher Education and Vocational Education –National Languages and Humanities Branch
The National e-learning Portal for the General Education

## පුරවැසි අධ්‍යාපනය I - පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 1 | 31. | 3 |
| 02. | 1 | 12. | 1 | 22. | 2 | 32. | 2 |
| 03. | 4 | 13. | 3 | 23. | 3 | 33. | 1 |
| 04. | 2 | 14. | 3 | 24. | 3 | 34. | 4 |
| 05. | 4 | 15. | 4 | 25. | 1 | 35. | 4 |
| 06. | 4 | 16. | 1 | 26. | 4 | 36. | 3 |
| 07. | 3 | 17. | 2 | 27. | 1 | 37. | 4 |
| 08. | 4 | 18. | 1 | 28. | 2 | 38. | 1 |
| 09. | 1 | 19. | 3 | 29. | 2 | 39. | 2 |
| 10. | 2 | 20. | 4 | 30. | 3 | 40. | 4 |

**(මුළු ලකුණු 1×40 = 40)**

## පුරවැසි අධ්‍යාපනය II - පිළිතුරු පත්‍රය

1.

I.
- රදළ ආණ්ඩු ක්‍රමය
- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය
- රාජාණ්ඩු ක්‍රමය **(මින් ඕනෑම කරුණු දෙකක්)**

II.
- ආගම
- ඇඳුම්
- භාෂාව
- සිරිත් විරිත්
- දැනුම
- ආචාර ධර්ම.... ආදී වශයෙන් **(මෙවැනි ඕනෑම අදාළකරුණු දෙකක්)**

III.
- යොදාගන්නා ශිල්පීය ක්‍රමය
- නිෂ්පාදනය කරනු ලබන්නේ කුමන අංශයෙන්ද

IV.
- සහයෝගීකාරී
- බලහත්කාරී

V.
- දේපළ රාජසන්තක කිරීම
- මරණ දඬුවම
- සිරගත කිරීම

VI.
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්
- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්

VII.

- අජෛව සංරචක
- ජෛව සංරචක
- සමාජ පරිසරය
- ස්වාභාවික පරිසරය **(මින් ඕනෑම කරුණු දෙකක්)**

VIII.

- ද්විපාර්ශ්වික වෙළඳාම
- බහු පාර්ශ්වික වෙළඳාම

IX.

- සරල බහුතර නියෝජන ක්‍රමය
- සමානුපාතික නියෝජන ක්‍රමය
- මිශ්‍ර නියෝජන ක්‍රමය **(මින් ඕනෑම කරුණු දෙකක්)**

X.

- ආගමික වතාවත් කෙරෙහි යොමුවීම
- මනෝ විද්‍යාත්මක අභ්‍යාස මගින්
- උපදේශනය මගින්
- ස්වභාවික පරිසරය නිරීක්ෂණය මගින් **(මින් ඕනෑම කරුණු දෙකක්)**

**(ලකුණු 2×10 = 20)**

2.

I.

- ඉන්දියාවේ වජ්ජි ජනපදය
- ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යය

**(ලකුණු 02)**

II.

- නිදහස් හා අපක්ෂපාතීව කටයුතු කිරීම
- සත්‍ය තොරතුරු වගකීමකින් යුතුව සැපයීම
- නිවැරදිව ජනමතය ගොඩනැගීමට කටයුතු කිරීම
- සත්‍ය හා නිවැරැදි තොරතුරු ජනතාව වෙත සැපයීම
- අපක්ෂපාතී ව සහ සමාජයේ යහපැවැත්මට හිතකර අන්දමින් තොරතුරු සැපයීම
- ජනතාවගේ දුක් ගැනවිලි පාලක පක්ෂයේ අවධානයට යොමු කිරීම
- පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතට යොමු කිරීම
- ජනතාවගේ දැනුම වර්ධනය කිරීම
- කාලීන තොරතුරු නිසි වේලාවට ජනතාවට ලබා දීම

**(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම
- පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ පාලක, පාලිත දෙපක්ෂයම දැනුවත් වීම
- අත්තනෝමතික පාලනය වළක්වාගත හැකි වීම
- මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම
- පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම
- පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ පාලක හා පාලිත දෙපක්ෂය ම දැනුවත් වීම
- පාලකයන් අත්තනෝමතික ලෙස ක්‍රියා කළහොත් එය වළක්වා ගත හැකි වීම
- අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීම

- මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම
- ආණ්ඩු ක්‍රමයට සම්බන්ධ ආයතනවලින් රට වැසියන්ට සිය අවශ්‍යතා, සිතුම් පැතුම් ඉටු කර ගත හැකි වීම
- නීතියේ රැකවරණය සැමට සමානව ලැබීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- ඉන් එක් ප්‍රයෝජනයක් රටකට වැදගත් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කළ යුතුය.

**(ලකුණු 03)**

3.

I.

- විජය ඇතුළු පිරිස පැමිණීම
- විජයගේ අභිෂේකය සඳහා ගෙන්වූ කුමරිය ඇතුළු පිරිස පැමිණීම
- පඬුවස්දෙව් ඇතුළු පිරිස පැමිණීම
- භද්දකච්චායනා ඇතුළු පිරිස පැමිණීම
- මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස පැමිණීම
- සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස පැමිණීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

II.

- එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනා ගැනීම හා අවබෝධයෙන් යුතු ව කටයුතු කිරිම.
- එකිනෙකාට ගරු කිරීම අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
- ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම
- සාමූහිකත්වය වර්ධනය කිරීම
- එක්සත් ව කටයුතු කිරීමෙන් ජයග්‍රහණ ලබා ගැනීම පහසු බව අවබෝධ කර ගැනීම
- අනෙකුත් ජන වර්ගවල භාෂාවන් ඉගෙනීම හා භාවිතය
- සර්ව ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම
- සමානාත්මතාවය

**(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.
- ගැටුම් අවම වේ.
- අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වේ.
- එක් ජාතියක්, එක් රටක් යන හැඟීම වර්ධනය වේ.
- මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ.
- රටේ සංවර්ධනය වෙනුවෙන් සෑම පුරවැසියකු ම නොපිරිහෙලා කටයුතු කිරීම හා එය ජාතික යුතුකමක් සේ සලකා කටයුතු කිරීමට පෙළඹේ.
- අන්‍ය ආගම්වලට හෝ සංස්කෘතීන්ට අගරු නොවන ආකාරයට හැසිරීමට හුරු වේ.

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- (a) හි සඳහන් කළ **එක්** කරුණක් රටේ ප්‍රගමනයට හේතුවන ආකාරය කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතු ය. **(ලකුණු 03)**

4.

I.

- උතුරු කොරියාව
- කියුබාව **(ලකුණු 02)**

II.

- බහු ජාතික සමාගම් බිහි වීම
- විවිධ රටවල පවතින බදු සහන, අඩු මිල ශ්‍රමය
- ලිහිල් පාරිසරික නීති වැනි සාධක පදනම් කරගෙන ආයෝජනය කිරීම
- විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ලෝකයට හඳුන්වා දීම
- විවිධ කලාපීය සහයෝගිතා සංවිධාන බිහි වීම
- දේශීය මුදල් විදේශවලට ඇදී යාම
- ලෝකයේ බලවත් රටවල් තම දේශපාලන බලය අනෙකුත් රටවලට ව්‍යාප්ත කිරීම
- තොරතුරු තාක්ෂණයේ විප්ලවීය වෙනසක් සිදු වීම
- වෙළෙඳාමට තිබූ බාධා ඉවත් කරමින් නිර්බාධ වෙළෙඳාම ඇති වීම
- ශ්‍රම හා ප්‍රාග්ධන සචලතා
- ලෝක නිෂ්පාදන මත ආර්ථික කටයුතු සිදු වීම

**(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම
- වැඩ ලෝකය තුළ නව රැකියා අවස්ථා නිර්මාණය වීම නිසා සේවා වියුක්තිය අඩුවීම
- දේශීය නිෂ්පාදන සාධකවලට වැඩි ඉල්ලුමක් ඇති වීම
- කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇති වීම
- ජාත්‍යන්තර වෙළඳ පොළ පදනම් කරගත් දේශීය නිෂ්පාදන බිහි වීම
- ගෙවුම් ශේෂ තත්ත්වය යහපත් වීම
- ආර්ථිකය විවිධාංගීකරණය වීම
- ගුණාත්මක බවින් ඉහළ නිෂ්පාදන බිහි වීම (නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා භාණ්ඩවල ගුණාත්මකභාවය ඉහළ යාම)
- විදේශීය විශේෂඥ දැනුම මෙරටට ගලා ඒම නිසා දේශීය මානව සම්පත දියුණු වීම
- නිෂ්පාදන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පුළුල් වීම
- දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි වීම
- මහා පරිමාණ කර්මාන්ත නගරයෙන් බැහැර ව ස්ථානගත වීම නිසා ප්‍රාදේශීය සංවර්ධනයක් සිදු වීම
- විවිධ කලාපීය සංවිධාන හා එකතු වීමට හැකි වීම
- අකාර්යක්ෂම කර්මාන්ත වෙළෙඳ පොළෙන් ඉවත් වීම
- දේශීය පාරිභෝගිකයාට ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු භාණ්ඩ ලබා ගැනීමට ඉඩ සැලසීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- (a) හි සඳහන් **එක්** බලපෑමක් කෙටියෙන් විස්තර කර තිබිය යුතුය. **(ලකුණු 03)**

5.

I.

- දළ ජාතික නිෂ්පාදිතය
- ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය
- මූර්ත දළ ජාතික නිෂ්පාදිතය
- ආර්ථික වර්ධන වේගය

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

II.

- පරිසර දූෂණය
- ජාත්‍යන්තර ත්‍රස්තවාදය
- අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුව
- බල ශක්ති අර්බුදය
- වෙළෙඳ පොළ තරඟය
- සමාජීය ගැටලු උග්‍ර වීම (අන්තර්ජාලය මගින් එල්ල වන)
- ස්වාභාවික විපත් වැඩි වීම
- නව කාර්මික රටවලින් එල්ල වන වෙළෙඳ පොළ තරඟය

**(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- 5S - ඵලදායිතා සංකල්පය භාවිතය
- CP - සුපිරිසිදු නිෂ්පාදනය
- GP - හරිත ඵලදායිතාව (Green Productivity)
- TQM - පූර්ණ ගුණාත්මක කළමනාකරණය (Total Quality Management)
- Poka Yoke - වැරදි ශුන්‍ය කිරීම
- PPP - බැහැර කිරීමේ වගකීම නිෂ්පාදකයාට පැවරීම
- 3R සංකල්පය

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- ඉහත (a) හි සඳහන් කළ **එක්** උපාය මාර්ගයක් කෙටියෙන් විස්තර කර තිබිය යුතු ය. **(ලකුණු 03)**

6.

I.

- අන්තර්ජාතික වෙළෙඳාම
- ණය හා ආධාර දීම
- ආර්ථික සංවර්ධනය
- ආරක්ෂක ක්ෂේත්‍රය
- රැකියා සැපයීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

II.

- සම්පත් විසංතුලනය හෙවත් එක් එක් රටවල පවතින සම්පත්වල වෙනස්කම්
- අවශ්‍යතා සියල්ල ම තම රට තුළ නිපදවාගත නොහැකි වීම
- අතිරික්ත නිෂ්පාදන අලෙවි කර ගැනීම
- ප්‍රවාහන හා සන්නිවේදන දියුණුව
- දියුණු තාක්ෂණය ලබාගැනීමේ අවශ්‍යතාවය

- හදිසි ආපදා හා වෙනත් විපත් අවස්ථාවල දී සහාය ලබාගැනීම
- දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීම

**(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- මහා මණ්ඩලය
- ආරක්ෂක මණ්ඩලය
- මහලේකම් කාර්යාලය
- ජාත්‍යන්තර අධිකරණය
- භාරකාර මණ්ඩලය
- ආර්ථික හා සමාජ මණ්ඩලය

**(මින් ඕනෑම ආයතන දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- (a) හි දැක්වූ එක් ආයතනයක කාර්යයන් **තුනක්** කෙටියෙන් විස්තර කර තිබිය යුතුය.

**මහා මණ්ඩලය - බලතල හා කාර්යය**

- එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අදාළ ඕනෑ ම කරුණක් පිළිබඳව සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම
- ආරක්ෂක මණ්ඩලය හා සෙසු ආයතනවලින් ලැබෙන වාර්තා සලකා බැලීම
- සංවිධානයේ අය-වැය ලේඛනය සැකසීම, .......... ආදී වශයෙන්

**ආරක්ෂක මණ්ඩලය - බලතල හා කාර්යය**

- අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම
- අන්තර්ජාතික ගැටුමකට හේතු විය හැකි ඕනෑ ම ආරවුලක් පිළිබඳව පරීක්ෂා කිරීම
- එවැනි ආරවුල් සමථයකට පත්කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම
- ආක්‍රමණිකයෙකුට එරෙහිව පියවර ගැනීම
- අවි පාලනය සඳහා සැලසුම් සම්පාදනය

**භාරකාර මණ්ඩලය - බලතල හා කාර්ය**

- භාරකාර ක්‍රමයට ගැනෙන භූමි ප්‍රදේශවල පරිපාලනය අධීක්ෂණය කිරීම
- භාරකාර ප්‍රදේශවල ජනයාගේ අභිවෘද්ධිය සැලසීම
- ස්වයං පාලනය හෝ ස්වාධීනත්වය හෝ වෙත ළඟා වීම සඳහා හුරු කරවීම

**ජාත්‍යන්තර අධිකරණය - බලතල හා කාර්ය**

- එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා ඊට අනුබද්ධ ආයතනවලට අවශ්‍ය නීති උපදෙස් සැපයීම.
- සාමාජික රටවල් විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි විභාග කිරීම
- සාමාජික රටවල් ඉදිරිපත් කරන පැමිණිලිවලට අදාළ විභාග සඳහා සහභාගි වන්නේ නම් ජාත්‍යන්තර අධිකරණය ලබා දෙන තීන්දුව පිළිගැනීම

**ලේකම් කාර්යාලය - බලතල හා කාර්ය**

- සංවිධානයේ වාර්ෂික වාර්තාව පිළියෙල කොට ඉදිරිපත් කිරීම
- එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා පාලනය කිරීම
- අර්බුද නිරාකරණය සඳහා සාම දූතයෙකු වශයෙන් මැදිහත් වීම
- එක්සත් ජාතීන්ගේ විෂය කරුණුවලට අදාළ ජාත්‍යන්තර සමුළු කැඳවීම
- ජනාවාස සේවා පවත්වා ගෙන යාම

**(ලකුණු 03)**

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

7.

I.

- උඩරට නීතිය
- තේසවලාමේ නීතිය
- මුස්ලිම් නීතිය

**(මින් ඕනෑම නීති දෙකක් සඳහා ලකුණු 02)**

II.

- ශ්‍රේෂ්ඨාධිකරණය
- ඔම්බුඩ්ස්මන්ධුරය (පාර්ලිමේන්තු කොමසාරිස්)
- මානව හිමිකම් කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම

**(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම
- නීතිය පිළිබඳව සෑම පුරවැසියෙකුට ම අවබෝධයක් තිබීම
- නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් ලෙස නොසැලකීම
- සාධාරණ ව හා අප්‍රමාද ව යුක්තිය පසිඳලීම
- පුද්ගලයන්ගේ තරාතිරම, රැකියාව, ධනය හෝ වෙනත් කරුණු පදනම් කරගෙන නීතිය ක්‍රියාත්මක නොවීම
- නීතිය ඉදිරියේ සෑම දෙනා ම සමාන පුද්ගලයන් සේ සැලකීම
- විනිශ්චයකාරවරුන්ට තම තීන්දු ගැනීමේ දී බලපෑම් සිදු නොවීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- (a) හි සඳහන් කළ ඒක් කරුණක් සාධාරණ හා යුක්ති සහගත සමාජයක් බිහිකිරීම සඳහා දායක වන ආකාරය කෙටියෙන් විස්තර කර තිබිය යුතුය. **(ලකුණු 03)**

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]